පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.4,786,065 ක් වූ ණය හිමියන් සඳහා අනුමැතියකින් තොරව ජර්නල් සටහන් අංක 72 මඟින් කපා හැරීම හේතුවෙන් එම වටිනාකම ණය හිමියන් අඩුවෙන්ද සමුච්චිත අරමුදල වැඩියෙන්ද දක්වා තිබුණි.

(ආ) ජර්නල් සටහන් අංක 71 මඟින් නිසි අනුමැතියකින් තොරව ආදායම් ණයගැතියන් රු.4,406,666 කින් කපා හැරීම හේතුවෙන් එම වටිනාකමින් ආදායම් ණයගැතියන් සහ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.7,455,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 03 ක් සඳහා ස්වයංක්‍රීයව ආයෝජන වටිනාකම එකතු කරන ලද රු.278,317 වූ පොලී මුදල් ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාලව ආයොජන ආදායම් ලෙස වෙන් කිරීම් නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමට පමණක් බැරකර තිබුණි.

(ඇ) සැපයුම් ණයහිමි, විවිධ ණයහිමි, නොගෙවූ වැටුප් හා වේතන සහ කර්මාන්ත ණයහිමියෝ එක් ලෙජර් ගිණුමක් මඟින් විවිධ ණයහිමියන් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට එක් එක් ගිණුම්වලට අදාල ශේෂයන් වෙන වෙනම හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ලෙජර් ගිණුම් විෂයයන් 02 කට අදාලව ගිණුමේ දැක්වෙන ශේෂය හා ඊට අනුරූපී උපයෝගී ලේඛනවල වූ ශේෂ අතර රු.472,803 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂය රු. 69,296,920 ක් වූ අතර එයින් රු.42,039,689 ක ශේෂයන්ට අදාල කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. රු.291,678 ක් වූ ශේෂ වසර 03 කට වැඩි කාලයක සිට නිරවුල් නොවූ ශේෂයන්වලින් සමන්විත විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.61,351,950 ක් වූ අතර ඉන් රු.16,477,660 වූ ශේෂ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ අතර, රු.1,860,476 ක ශේෂ වර්ෂ 03 ට වැඩි කාලයක සිට පැවත එන ශේෂ විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ රු.4,786,065 ක ණයහිමි ශේෂ හා රු.4,406,665 ක ණයගැති ශේෂ කපා හැරීමට පෙර ලබාගත් අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවුණි.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි පදනම මත සිදුකරන ලද විගණන පරීක්ෂාවන්හිදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභාබල ප්‍රදේශයේ වරිපනම් හා බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,813,832 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුවරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,452,554 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,361,278 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.30,559,786 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.63,634,497 ක ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු. 3,260,879 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම හා වියදම අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම (10,20,30,40) | 59,103 | 52,215 | 6,888 | පෞද්ගලික පඩිනඩි | 56,398 | 44,303 | 12,095 |
| (ii) | වෙනත් | 68,117 | 57,034 | 11,083 | අනෙකුත් | 41,008 | 41,493 | (485) |
| | උප එකතුව (50,60,70) | 127,220 | 109,249 | 17,971 | උප එකතුව | 97,406 | 85,796 | 11,610 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 30,560 | 58,291 | (27,731) | ප්‍රාග්ධන වියදම | 63,635 | 82,570 | (18,935) |
| | මුළු එකතුව | 157,780 | 167,540 | (9,760) | මුළු එකතුව | 161,041 | 168,366 | 7,325 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 29,814 | 23,453 | 5,640 | ඌනතාවය | (3,261) | (826) | 2,435 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.127,219,571 න් දළ වශයෙන් සියයට 54 ක් හෙවත් රු.68,116,715 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.30,559,786 ක මුළු ප්‍රමාණයම පළාත් නිශ්චිත, පළාත් ආයෝජන, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මඟින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.97,405,740 න් දළ වශයෙන් සියයට 58 ක් හෙවත් රු.56,397,592 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 53 ක් හෙවත් රු.51,956,149 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.63,634,497 න් දළ වශයෙන් සියයට 46 ක් හෙවත් රු.29,373,085 ක් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමටද, ඉතිරි සියයට 54 ක්වූ රු.34,261,412 ක ප්‍රමාණය පළාත් නිශ්චිත, පළාත් ආයෝජන, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි වේ.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 2,012 | 2,129 | 1,338* | 2,007 | 2,194 | 1,450 |
| (ii) | බදුකුලී | 22,261 | 23,608 | 1,008 | 53,586 | 29,473 | 756 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,161 | 2,231 | - | 2,106 | 1,953 | - |
| (iv) | වෙනත් ආදායම් | 103,180 | 99,252 | 46,509 | 69,767 | 75,630 | 38,567 |
| | එකතුව | 129,614 | 127,220 | 48,855 | 127,466 | 109,250 | 40,773 |

(අ) වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයට අදාල රු.2,012,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද වාර්ෂික බිල් කිරීම රු.2,129,000 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.1,337,571 ක හිඟයක් පැවති අතර 2016 මාර්තු 31 දින වන විට හිඟ ශේෂයෙන් රු.446,388 ක මුදලක් අයකර පැවතුණි.

(ආ) බදු කුලී යටතේ සමාලෝචිත වර්ෂයට අදාළව රු 22,261,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද වාර්ෂික බිල් කිරීම රු 23,608,044 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 1,007,697 ක හිඟයක් පැවති අතර, 2016 මාර්තු 31 දින වන විට හිඟයෙන් රු.769,646 ක මුදලක් අයකර තිබුණි.

### 2.3.2 <u>බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්</u>

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | ආදායම් රැස් කිරීම | | | හිඟහිටි ශේෂය 2015/12/31 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | *2015/12/31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු (10) | 1,378 | 2,129 | 3,507 | 598 | 1,734 | 2,332 | 780 | 395 | 1,175 |
| බදුකුලී (20) | 835 | 23,608 | 24,443 | 428 | 23,007 | 23,435 | 407 | 601 | 1,008 |
| බලපත්‍ර ගාස්තු (30) | - | 2,230 | 2,230 | - | 2,230 | 2,230 | - | - | - |
| වෙනත් ආදායම් (40,50,60,70) | 38,760 | 99,252 | 138,012 | 17,147 | 83,784 | 100,931 | 21,613 | 15,468 | 37,081 |
| එකතුව | 40,973 | 127,219 | 168,192 | 18,173 | 110,755 | 128,928 | 22,800 | 16,464 | 39,264 |

* සභාවේ ආදායම් ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු හේතුවෙන් ගණනය කිරීම අනුව 2015 ජනවාරි 01 හා දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් සමඟ නොසැසදේ.

### 2.3.3 <u>වරිපනම් බදු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නව ඉඳි කිරීම් සඳහා අනුමත කරනු ලබන ඉඳි කිරීම් සැලසුම් පිළිබඳව පසු විපරම් කර අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් බදු සංශෝධනය කර අය කිරීමට කටයුතු කර නොතිබුණි. අවසන් වරට 2012 වර්ෂයේදී නව තක්සේරුවක් සිදු කරන කාලපරිච්ඡේදයේ ඉඳි කරමින් පැවති ගොඩනැගිලි හා නිවාස 49 ක් සඳහා 2015 වර්ෂය දක්වාම එම දේපල අයිතිකරුවන්ගෙන් රු.500 ක වාර්ෂික වටිනාකමට රු.25 ක් පමණක් ගාස්තු අයකර තිබුණි. මේ හේතුවෙන් සභාවට විශාල වරිපනම් ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) හෙට්ටිපොල නගරයේ බස් නැවතුම්පොල ඉදිරිපිට පිහිටි වරිපනම් බදු අංක 117/A, 119, 119/2, 119/A) වර්ග මීටර් 694 ක් වූ මහල් 04 න් සමන්විත ගොඩනැඟිල්ල නිමකර 2013 වර්ෂයේදී ව්‍යාපාරික කටයුතු ආරම්භ කර තිබූ නමුත් අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. සභා නිලධාරීන් විසින් මේ පිළිබඳ පසු විපරම් කටයුතු කර නව ගොඩනැඟිල්ල තක්සේරු කර වරිපනම් බදු අයකර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු අංක 153 දරන මහජන බැංකු ගොඩනැගිල්ල 2014 වර්ෂයේ සිට භාවිතයට ගෙන තිබූ නමුත් සභාව වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. ලංකා බැංකු ගොඩනැගිල්ල සඳහා රු.12,150 ක වරිපනම් බදු ආදායමක් වාර්ෂිකව අයවී තිබූ අතර මෙම ගොඩනැගිල්ල මඟින්ද ඒ හා සමාන ආදායමක් උපයාගත හැකිව තිබුණි.

### 2.3.4 <u>බදු කුලී</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයට අදාලව සභා වත්කම් හා දේපල අයිතිය බදු දීම යටතේ අවම ලංසුව රු.37,026 ක් වන වත්කම් 02 ක් බදු දීම සඳහාද, අවම ලංසුව රු.455,626 ක් වන වත්කම් 12 ක දේපල බදු දීම සඳහාද, 04 වරක් මිල ගණන් කැඳවීම් කළද, බදුකරුවන් ඉදිරිපත් නොවීම මත බදු දීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා බිල්කර තිබූ කිරිමැටියාව මංසන්දියේ මාළු කුටිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.27,090 ක් අයකර ගැනීමට තිබුණි. 2016 මාර්තු 31 දිනය වන විට තවදුරටත් රු.10,043 ක මුදලක් අයවීමට තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මාවී ඇළ සතිපොළ කුකුල් මස් කඩය සඳහා රු.49,500 ක් බිල්කර තිබුණද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 වර්ෂයේ බදුදෙනු ලැබූ මඩීගේ අනුක්කනේ ගවමස් කඩය සඳහා රු.60,300 ක්ද, හෙට්ටිපොල කුකුල් මස් කඩය සඳහා රු.23,707 ක්ද ලෙස එකතුව රු.84,007 ක හිඟ මුදල් දෙසැම්බර් 31 දිනට පැවති නමුත් 2016 මාර්තු 31 දිනය වන විට එයින් රු.51,776 ක මුදලක් හිඟව පැවතුණි.

(ඉ) හෙට්ටිපොල බස් නැවතුම්පොළ කඩ කාමර ටෙන්ඩර් කර පෙර ගෙවුම් ක්‍රමයට ලබාදීමේදී දෙවරක් මිල ගණන් කැඳවුවද අවම ලංසුව රු.16,225,000 ක් වූ කඩ කාමර 07 ක් විගණන අවස්ථාව වූ 2015 ඔක්තෝබර් 05 වන විටද ලබාදීමට නොහැකි වී තිබුණි.

2014 වර්ෂයට අදාලව කඩ කාමර පෙර ගෙවුම් ක්‍රමයට ලබාදීමේදී ලංසුව පිළිගත් බවට දැනුම් දුන් පසු, දින 14 ක් ඇතුලත පෙර ගෙවුම් මුදල් ගෙවිය යුතු වුවද, 2014 මාර්තු 06 ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දුන්නද වත්කම් 11 ක් සඳහා රු.16,435,465 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව තිබුණි.

(ඊ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩ කුලිය සංශෝධනය කළයුතු වුවද, සභාවේ විජය උදාගම වෙළඳ සංකීර්ණය, කඹුරාපොල වෙළඳ සංකීර්ණය, හෙට්ටිපොල B,C හා D වෙළඳ සංකීර්ණවල කුලී වසර 14 ත් 27 ත් දක්වා කාලයක සිට සංශෝධනය කර නොතිබුණි.

(උ) කඩ කාමර 10 කින් යුතු හෙට්ටිපොල බහු කාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 01 හා 02 ක ලංකා බැංකුව හෙට්ටිපොල ශාඛාව වෙත ලබා දී තිබූ අතර 2014 ඔක්තෝබර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි 2015 මැයි 14 දින අත්සන් කල බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව නියමිත බදු මුදල් සෑම මසකම පළමු දිනට ගෙවිය යුතු වුවද, අදාල බදු මුදල් ගෙවීම් ප්‍රමාදකර තිබුණි. සභාව විසින් කඩ කුලී සම්බන්ධයෙන් අත්සන් කරණු ලබන අනිකුත් ගිවිසුම්වල දඩ සම්බන්ධ කොන්දේසි අන්තර්ගතව පැවතියද, මෙම ගිවිසුමෙහි එවැනි කොන්දේසියක් අන්තර්ගත නොවීම මත සභාවට ඒ සඳහා දඩ මුදල් අය කිරීමට නොහැකි වී තිබුණි.

(ඌ) අවම ලංසුව රු.1,225,950 ක් වූ හෙට්ටිපොල ඒකාබද්ධ ගවමස් කඩය 2015 වර්ෂය සඳහා තෙවරක් ටෙන්ඩර් කැඳවූවද, කිසිදු ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවීම මත 2015 ජනවාරි 20 දින පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් ලංසු වටිනාකමින් සියයට 10 ක් අඩුකර නැවත ටෙන්ඩර් කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර 2014 වර්ෂයේ බදුකරුගේ ඉල්ලීම මත 2015 ජනවාරි සිට 2015 ජූලි දක්වා 2014 මිල පදනම්ව ගිවිසුමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි. නමුත් 2015 ජූලි මාසයේ වාරිකය නොගෙවීම මත බදු කුලිය රු.92,884 ක මුදල හා ඊට අදාල දඩ මුදල් අයකර ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

## 2.3.5 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.910,286 ක හිඟ ජල ගාස්තුවක් පැවතුණි. එයින් රු.492,948 ක් ඉකුත් වර්ෂයන්ට අදාල හිඟයන් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අක්කර බදු හිඟ රු.90,462 ක ශේෂයක් පැවතුණි. මේ තුළ ඇති රු.77,331 ක් ඉකුත් වර්ෂයන්ට අදාල හිඟයන් විය.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකතන සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර කුළුණු ඉදි කිරීම සඳහා ගොඩනැගිලි ඉල්ලුම්පත් ලේඛණයෙහි කුළුණු 22 කට අදාල ඉල්ලුම්පත් ගොණු කර තිබුණි.

## 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.5,824,151 ක්ද මුද්දර ගාස්තු රු.25,312,646 ක්ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා

කැබැල්ලවල පිහිටි කැබැල්ලවල හේනයාය සහ මීගහමුල හේන අක්කර 03 රූ 01 පර්චස් 20 ක ඉඩම සභාවේ අනුමැතියකින් තොරව 2015 අප්‍රේල් 22 වන විට වෙන්දේසි කර අවසන් කර ඇති බව අනාවරණය වූ පසු 2015 මැයි 11 දින අනු බෙදුම අනුමත කර තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට රු.643,652 ක් වියදම් දරා ක්‍රියාත්මක කරන ලද කොන්ක්‍රීට් කුට්ටිගල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමෙන් 2015 වර්ෂයේදී සභාව විසින් කුට්ටිගල් 712,500 පමණ මිලදීගෙන මාර්ග 80 ක් සංවර්ධනය කර තිබුණි.

(ආ) ඉරිදා දිනයේ පවත්වනු ලබන මාවි ඇල සතිපොල විධිමත්ව වෙන්කරන ලද වෙළඳ කුටි 45 ක් සහ විවෘත ප්‍රදේශයද ඇතුලත්ව වෙළඳුන් 150 ක පමණ ධාරිතාවක් පැවතියද, වෙළඳුන්ගේ සාමාන්‍ය පැමිණීම 20 ත් 25 සහ ආදායම රු.3,000 ක් හා රු.7,000 ක් අතර පැවතුණි.

(ඇ) මල්වානේගෙදර සතිපොල තුල විධිමත්ව වෙන් කරන ලද වෙලඳ කුටි 96 ක් ද ඇතුලත්ව විවෘත භූමියද සලකා වෙලඳුන් 130 ක පමණ ධාරිතාවක් පැවතියද, දකුණු පස කොටසෙහි වෙන්කර ඇති වර්ග අඩි 300 ක වෙලඳ කුටි 12 ක් පාරිභෝගික ප්‍රවේශ මාර්ගය පටුවීම හේතුවෙන් කිසිදු වෙලෙන්දෙකු පොල කටයුතු විවෘත කල දින සිට ව්‍යාපාර කටයුතු සිදුකර නොතිබුණි. ඊට විසඳුමක් ලෙස 2015 අප්‍රේල් වන විට රු.7,800 ක වියදමක් දරා නව ගේට්ටුවක් ඉදිකර තිබුණද, එයින්ද බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

2015 වර්ෂයේදී රු.1,013,639 ක පළාත් නිශ්චිත ප්‍රතිපාදන මත දොලහමුණ වත්ත දෙවන පටුමග සංවර්ධනය කිරීමේ I අදියර කුට්ටිගල් ඇල්ලීමේදී මාර්ග තලය මත ABC මිශ්‍රණය අතුරා ටොන් 8-10 රෝලෙන් තැලීම සඳහා ඇස්තමේන්තු මුදලින් රු 158,827 ක් හෙවත් සියයට 15 ක් වෙන්කර තිබුණද එහි ඉතිරි කොටස හෙවත් දෙවන අදියරේ රු.500,000 ක ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ABC මිශ්‍රණය අතුරා ටොන් 8-10 රෝලෙන් තැලීම නොකර මාර්ග තලය මත කුට්ටිගල් ඇල්ලීම පමණක් සිදුකර තිබුණි.

## 04. යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

## 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

### 4.3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රු.643,652 ක පිරිවැයක් දරා ආරම්භ කළද, රු.399,800 ක වත්කම් වර්ෂ 04 ක කාලයක සිට ද රු.44,149 ක් වූ කුට්ටි ගල් පදම් කරන ටැංකි 01 ක් වර්ෂ 02 කට ආසන්න කාලයක සිටද රු.199,703 ක් වූ කුට්ටිගල් අංගනය වර්ෂයක පමණ කාලයක සිට ද නිෂ්කාර්යව තිබුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) ඉඩම් කට්ටි කිරීම හා වෙන්දේසි කිරීම
(ඇ) ආදායම් පරිපාලනය